# ඡායා රූ පිළිසඳර

2010 මාර්තු /අප්‍රේල්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**


## ලැබුවා වූ සිංහල - හින්දු අලුත් අවුරුද්ද සියලු පැතුම් ඉටුවන ඉසුරුමත් නව වසරක් වේවා..



### "දිගැසිය නෙත රැඳි රූ" කාන්තා ඡායාරූප ප්‍රදර්ශනය

ලංකා ප්‍රභාලේඛිකා සංසදය විසින් තෙවන වරටත් ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී ඇති මාර්තු මස 08 වැනි දින සැමරීම සඳහා "දිගැසිය නෙත රැඳි රූ" නමින් කාන්තා ඡායාරූප ප්‍රදර්ශනයක් පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය 2010 මාර්තු මස 06,07 හා 08 යන තෙදින තුළ කොළඹ ජාතික කලා භවනේ දී පැවැත්විණ. මෙම ප්‍රදර්ශනය මාර්තු මස 06 වැනි දින ප.ව. 4.30 ට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ ලේකම් ඒ. දිසානායක මහතාගේ හා ප්‍රවීණ මාධ්‍යවේදීන් ඇතුළු සම්භාවනීය ශිල්පිනීන් රැසකගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණ.

මෙම තරගයේ ඡායාරූප ඇගයීම ප්‍රවීණ ඡායාරූප ශිල්පීන් වන බන්දු ගුණරත්න, අනෝමා රාජකරුණා සහ සිතුමිණි රත්නමලල යන මහත්ම මහත්මීන් විසින් සිදු කරන ලදී.

### සංගමයේ 57 වන වාර්ෂික මහා සභා රැස්වීම-2010/2011

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම ජූනි මස 20 ඉරුදින පෙ.ව. 9.00 ට කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ නව නගර ශාලාවේ දී පැවැත්වේ. සාමාජික ඔබට ඒ සඳහා ගෞරවයෙන් ඇරයුම් කරමු.

*- ගරු අධ්‍යක්ෂ මණ්ඩලය -*

(මෙම පූර්ව සිහිපත් කිරීම ඔබගේ දින වකවානු වෙන්කර ගැනීම සඳහා ය. නිල ආරාධනා පත්‍රය පසුව යොමුකෙරේ. එදිනට පෙර මුදල් ගෙවා ඔබගේ සාමාජිකත්වය තහවුරු කරගෙන තිබීම අනිවාර්ය ය.)

### නව වසරේ පංති ආරම්භය හා ඉදිරි වැඩසටහන්

නව වසර සඳහා පංති පෙබරවාරි මස 14 වැනි දින ආරම්භ කෙරිණ. පංති සුපුරුදු පරිදි කොළඹ 10 ෆොස්ටර් පටුමගේ, මහා බෝධි විද්‍යාලයේ දී ඉරු දින ප.ව. 1.30 සිට 4.30 දක්වා පැවැත්වේ.

මැයි : 09 - කැළණි විහාරය චාරිකාව.
මැයි : 21,22,23 - තන්තිරිමලේ ඡායාරූප වැඩමුළු චාරිකාව.
ජූනි : 13 - ආලෝකකරණ වැඩමුළුව.
20 - වාර්ෂික මහා සභා රැස්වීම.
25,26,27 - පළමු වසර පොළොන්නරුව චාරිකාව.

### වෘත්තීය කණ්ඩායමේ මීලඟ වැඩමුළුව

වෘත්තීය කණ්ඩායම සංවිධානය කරන මීලඟ වැඩමුළුව 2010 ජූනි මස 12 දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී කලාත්මක ඡායාරූප නිර්මාණය සහ ඡායාරූපකරණයේ නිර්මාණාත්මක ප්‍රවණතා තේමා කරගනිමින් පැවැත්වේ.

මෙම වැඩමුළුව සම්මානලාභී ඡායාරූප කලාවේදීන් කිහිපදෙනෙකුගේ මෙහෙයවීමෙන් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර, ඔබගේ සහභාගීත්වය 0712791026 = නාරද, 0714268090 = අතුල, 0777751819 = උදේනි හෝ 0777399256 = සම්පත් වෙත තහවුරු කරන්න.

**සැරසෙන් ...!**
**එල්ලවෙන්....!!**
**යා..........!!! ................ කොයිබට ද?**

# FIAP ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයට
## *15th International Exhibition of Photography 2010*

Patronage No. 2010/111

ඔබේ නිර්මාණශීලීත්වය උරගා බැලෙන ඉහළ ම කඩඉම - FIAP ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය දැන් ලහි ලහියේ සූදානම් වෙමින් තිබේ. 2010 නොවැම්බරයේ කොළඹ දී පැවැත්වෙන ලොව ඡායාරූප කලාවේ විශිෂ්ටයින්ගේ නිර්මාණ එක්තැන් කෙරෙන ඡායාරූප ප්‍රදර්ශනයට ඔබේ නිර්මාණ ද අභිමානයෙන් ඉදිරිපත් කරන්න. ඔබේ මෙන් ම ඔබේ හිත මිතුරන් ද ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට දිරි ගන්වන්න.

අයදුම්පත් සංගමයෙන්, දිවයින පුරා අනිකුත් ඡායාරූප ශිල්ප සංගම් වෙතින්, කොළඹ යුනියන් පෙදෙසේ ඩිජිටල් එක්ස්පෝෂර් වර්ණ රසායනාගාරයෙන්, කුරුණෑගල සිරිසර වර්ණ රසායනාගාරයෙන් සහ තැපැල් මගින් ලබාගත හැකියි. වෙනත් විමසුම් සඳහා 071-2726517 අංකයෙන් සුනිල් වික්‍රම මහතා අමතන්න.

---

## 14 වන සැමරුම් කලඹට තරු 04 ක්




2008 දී අප සංගමය මගින් පවත්වනු ලැබූ FIAP ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ සමරු කලාපය, FIAP**** ප්‍රමිතියට පිළිගනු ලැබ ඇත. මෙය මෙතෙක් ලංකාවේ පැවැත්වූ ප්‍රදර්ශන සමරුවක් සඳහා ලැබුණු ඉහළ ම ජාත්‍යන්තර ඇගැයීම වේ.

එම විශිෂ්ටතාව දිනාගෙන සංගමයට ලබා දුන් ගෞරවය සම්බන්ධයෙන් හිටපු ප්‍රදර්ශන අධ්‍යක්ෂ සුනිල් වික්‍රම මහතාට ද, සමරු සැලසුම් අධීක්ෂණය සිදුකළ ආචාර්ය උ.ග. ගුණසේකර මහතාට ද, සමරු සැලැස්මේ නිර්මාණකරුවා වූ උපුල් ජයන්ත රණේපුර මහතාට ද අප සැමගේ ස්තුතිය පිරිනැමේ.

---

## 60වන සංවත්සර සැමරුම් මුද්දරය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 60 වන සංවත්සරය අළලා සැමරුම් මුද්දරයක් නිකුත් කිරීමට විධිවිධාන යොදා ඇත. මුද්‍රණය කරනු ලබන්නේ ඇණවුම් කරන මුද්දර සංඛ්‍යාව පමණක් බැවින් ඔබට මෙම සැමරුම් මුද්දරය අවශ්‍ය නම් 071-4402950 අංකයෙන් අශෝක බුද්ධදාස මහතා අමතා ඔබේ ඇණවුම තහවුරු කරන්න. රු 5/=- ක මුද්‍රිත මිල වටිනාකමක් සහිත මෙම මුද්දරය, තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් අපට ලබාගත හැකි වන්නේ රු 100/-= ක මුදලකට බැවි කරුණාවෙන් සලකන්න. මුද්දරය 60 වන සංවත්සර උළෙල සමාරම්භක අවස්ථාවේ නිල වශයෙන් නිකුත් කෙරේ.

---

## 60වන සංවත්සර සාමාජික සුහද හමුව







අපගේ ද්වී වාර්ෂික සාමාජික සුහද හමුව 2010.03.20 දින පැවැත්විණි. මෙම සුහද හමුව මෙවර ඉතා අලංකාර ස්වභාවික පරිසරයකින් යුතු හංවැල්ල අම්බලම නිවාඩු නිකේතනයේ දී පැවැත්වුණු අතර, එම අවස්ථාවට සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ හිතවතුන් හා පවුලේ අය 110 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වූහ. සහභාගි වූ සැමට හැටවන සංවත්සරය සඳහන් වටිනා මග් එකක් ලබා දීමට කටයුතු කරන ලදී.

වැඩිහිටියන් හා කුඩා ළමුන් සඳහා විවිධ තරග ඉසව් රැසක් සංවිධානය කර තිබූ අතර ඒවාට වටිනා කාගිල්ස් ත්‍යාග වවුචර් පිරිනමන ලදී. විශේෂයෙන් ම මෙවර පිහිනීම හා ජල ක්‍රීඩා කිරීමට ද අවස්ථාවක් ලබා දී තිබිණ. උදෑසන 9.00 සුහද හමුව ආරම්භව සවස 5.00 ට පමණ නිම විය.

බුෆේ ක්‍රමයට දිවා ආහරය ඉතා ප්‍රනීතව සංවිධානය කර තිබිණි. සවස කේක් සමග තේ පැන් සංග්‍රහයක් ද තිබිණි. පැමිණි සියලු දෙනාට ම ඉතාමත් ප්‍රීති දායක දිනයක් වූ බව පෙනෙන්නට තිබිණි. මේ අවස්ථාවට අපගේ සංගමයේ ප්‍රවීන හා පැරණි සාමාජිකයින් රැසක් ම පැමිණ සිටි අතර ඔවුනටත් සංගමයේ සාමාජික සුහද හමුව සඳහා ඇප කැප වී වැඩ කල සියලු ම දෙනාටත් මේ අවස්ථාවේ දී ස්තුතිය පුද කරමු. අම්බලම නිවාඩු නිකේතනයේ කළමණාකාර තුමා වන විල්ෆ්‍රඩ් පෙරේරා මහතා ඇතුලු කාර්ය මණ්ඩලයට ද අප සංගමයේ ස්තුතිය පුද කරමු.

# Felicitation NPAS
# 60 වන සංවත්සර සැමරුම් කලඹ

අප සංගමයේ දසක හයක ජාතික මෙහෙවර අළලා නිකුත් කෙරෙන විශේෂ සැමරුම් කලඹ සඳහා ඔබගේ දායකත්වය ද එක් කිරීමට සෙනෙහසින් ආරාධනා කර සිටිමු. මෙම සංවත්සර සැමරුම් කලඹ සංගමයේ එදා මෙදා තුර සියලු තොරතුරු ඇතුළත් කොට සම්පාදනය කරනු ලබන්නකි. සමාරම්භක සාමාජිකයින්, සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයින්, යාවජීව සාමාජික පිරිස, ගෞරව සභාගී සාමාජික භවතුන්, නිලධාරීන් ලෙස වගකීම් ඉසිලූ අය, ශාස්ත්‍රීය වශයෙන් ලබා ඇති ජයග්‍රහණ, සංගමයේ ඉතිහාසය, සමාජසේවා, අධ්‍යාපන, ප්‍රදර්ශන, සුබසාධන කටයුතු පිළිබඳ ඉතිහාසය පිළිබඳ ලිපි මෙහි ඇතුළත් ය. එසේ ම ප්‍රකාශන අංශයේ යටගියාව, වෘත්තීය කණ්ඩායම, ප්‍රභාලේඛිකා සංසදය, පාසල් වැඩසටහන් පිළිබඳ තොරතුරු ද වෙන් වෙන් වශයෙන් මෙයට අඩංගු වේ.

එසේ ම එදා මෙදා තුර අප සාමාජික භවතුන් අතින් නිර්මාණය වූ විශිෂ්ටතම ඡායාරූප 60ක් ද තෝරාගෙන ඇල්බමයක් වශයෙන් මෙම ග්‍රන්ථයට ඇතුළත් කෙරේ. ඉදින්, ඔබ වෙත මෙම සුවිශේෂ ප්‍රකාශනය සම්බන්ධයෙන් හෘදයංගම ආරාධනයන් තුනක් මෙහි දී ඉදිරිපත් කරමු.

**පළමුවැන්න :**

ඔබගේ ඡායාරූප අතුරින් විශිෂ්ටතම කලු සුදු ඡායාරූපයක් මෙම ඇල්බමයට ඇතුළත් කිරීමේ වරප්‍රසාදය ඔබට හිමි ය. ඒ සඳහා ඔබේ නිර්මාණය ජූනි 01 වන දිනට පෙර ඉදිරිපත් කළ හැකි ය.

(මුද්‍රිත ඡායාරූපයක් නම් 8"X10" ප්‍රමාණයෙන් ද ඩිජිටල් ඡායාරූපයක් නම් 300 dpi - Jpeg ආකාරයේ ද විය යුතු ය. ඡායාරූපයේ ප්‍රකාශනාත්මක අගය මෙන් ම මුද්‍රණ තත්වය පිළිබඳ විශේෂයෙන් සලකා බලා ඇල්බමය සඳහා තෝරා ගනු ලැබේ.)

**දෙවැන්න :**

වසර 25 කට වඩා පැරණි සංගමයේ තොරතුරු සහ අදාළ ඡායාරූප ඔබ වෙත ඇත්නම් ඒ පිළිබඳ දැනුම්දීමට කාරුණික වන්න. (විශේෂයෙන් විල්සන් හෑගොඩ මහතා, ශාන්ත වීරසිංහ මහතා, වොල්වින් සිරිවර්ධන මහතා, වී.හි. හපුආරච්චි මහතා, ඒ.ඒ.එස්. අමරසිංහ මහතා, ජේ.ඒ.සී. ජයසූරිය මහතා, ල. දයානන්ද මහතා, හිල්ටන් සමරසිංහ මහතා, ජී.එල්.ආර්. ද සිල්වා මහතා යන අයගේ ඡායාරූප අවශ්‍ය වී ඇත.)

**තුන්වැන්න :**

මෙම විශේෂ සමරු කළඹ වර්තමාන වෙළඳපොළ මිල ගණන් අනුව රු 3500/=- ක් පමණ වුව ද ඊට මිල නියම කොට ඇත්තේ රු. 1800/=- කි එයිනිදු කල්වේලා ඇතිව ඇණවුම් කරන අයට රු 1000/=- කට මෙය ලබාගත හැකි ය. ඒ නිසා ඔබේ ඇණවුම හැකිතාක් ඉක්මනින් රු 1000/=- මුදල ද සහිත ව මේ සමග වන කූපනය පූරවා ඉදිරිපත් කරන්න.

**Felicitation NPAS ඇණවුම**

නම : ..........................................................................

සාමාජික අංකය : ..........................................................................

දුරකථන අංකය : ..........................................................................

අවශ්‍ය පිටපත් ගණන : ..........................................................................

ගෙවනු ලබන මුදල : ..........................................................................

................................ ................................

දිනය අත්සන

මෙම විශේෂ කලාපය මුද්‍රණය කෙරෙනුයේ පිටපත් ඉතා සීමිත සංඛ්‍යාවක් පමණි. එබැවින් ඔබේ පිටපත නොවරදවා ලබා ගැනීම පිණිසත්, මුද්‍රණය සඳහා අත්‍යවශ්‍ය බරපැණ යම් තරමකින් හෝ සපුරාගැනීම පිණිසත් කඩිනමින් ඔබේ ඇණවුම ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඔබගේ වැඩිමනත් අවබෝධය පිණිස මෙම ග්‍රන්ථය පිළිබඳ තාක්ෂණික දත්ත පහත දක්වමු.

**Felicitation NPAS සංවත්සර සැමරුම් කලඹ**

| | |
|---|---|
| Pages | : 160 + |
| Inner Pages | : 80 gsm matt paper |
| Cover | : 400 gsm board with 230 gsm laminated jacket. |
| Size | : 210 x 260 mm |
| Selling Price | : Rs. 1500/- |

මේ සම්බන්ධ සියලු විමසීම් සඳහා 071 8106680 අංකයෙන් උදිත අමතන්න.

## 60 වන සංවත්සර යාවජීව සාමාජිකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය

අප සංගමයේ 60 වන සංවත්සරය නිමිති කොට ගෙන දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති පැරණි සාමාජිකයින් සඳහා යාවජීව සාමාජිකත්‍වය පිරිනැමීමේ විශේෂ කාල සීමාවක් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කෙට ඇත. ඒ අනුව දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති එහෙත් යළි සංගමයට සම්බන්ධවීමට කැමැත්තෙන් පසුවන සහ වසර පහකට වැඩි කාලයක් සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයින් වශයෙන් කටයුතු කළ අයට මේ සඳහා ඉදිරිපත් විය හැකි ය. ජූනි 01 දින සිට නොවැ 30 අතර කාලය තුළ පමණක් මෙම වරප්‍රසාදය ලැබිය හැකි වේ.

සංගමයට දැඩි ලෙස ඇලුම් කරන එහෙත් දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති ඔබ දන්නා අයට මේ පිළිබඳ දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමු. එලෙස යාවජීව සාමාජිකත්වය ලබා ගැනීමේ අභිලාෂයෙන් පසුවන අය, අවශ්‍ය වැඩිදුර උපදෙස් සඳහා 077-688879 අංකයෙන් එන්.ආර්. අභයසිංහ මහතා සමග සම්බන්ධ වන්න.

## සංවත්සර ශාස්ත්‍රීය සංග්‍රහය

අප සංගමයේ 60 වන සංවත්සර සැමරුම අළලා පර්යේෂණ ලිපි ඇතුළත් ශාස්ත්‍රීය සංග්‍රහයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ඇතුළත් කිරීමට අදහස් කරනුයේ ඡායාරූප ශිල්පය, සිනමාව, රූපවාහිනිය, විද්‍යුත් රූප මාධ්‍ය සහ දෘශ්‍ය සන්නිවේදනය යන විෂය ක්ෂෙත්‍රයනට අදාළ ලිපි සමුච්චයකි. සියලු ම ලිපි නව දැනුම සහිත නිරවද්‍ය කරුණු පදනම් කරගත් ශාස්ත්‍රීය ආකෘතියකට අනුව මූලාශ්‍ර ලේඛනයක් ද සහිත ව සම්පාදනය කළ යුතු ය. ලිපි සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ හැකි ය.

අප විෂය ක්ෂෙත්‍රය හා සම්බන්ධ පර්යේෂණාත්මක ලිපිවලින් සමන්විත ශාස්ත්‍රීය සංග්‍රහයක් මෙතෙක් අප රටේ නිකුත් වී නොමැති හෙයින් මෙය පුරෝගාමී ජාතික කාර්යභාරයක් වනු ඇත. මෙම අභිමානයේ කොටස්කරුවෙකු වීමේ හිමිකම ඔබට ද ගෞරව සම්ප්‍රයුක්තව පිළිගන්වනු කැමැත්තෙමු. ඒ අනුව මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ලිපියක් සකස් කිරීමට ඔබ අදහස් කරන්නේ නම් 2010 මැයි 31 දිනට ප්‍රථම අදළ මාතෘකාව ද සමගින් 071-8229204 අංකයෙන් විජය බස්නායක මහතා අමතන්න.

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## උත්සව, රැස්වීම් සහ පොදු කටයුතු සංවිධානයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

**අරමුණු**

සංගමයේ ගෞරවය ආරක්‍ෂා වන පරිදිත්, අනන්‍යතාව සුරැකෙන පරිදිත්, ක්‍රමවත් හා කාර්යක්‍ෂම ලෙසත් රැස්වීම් පැවැත්වීම සහ උත්සව කටයුතු සංවිධානය මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

**අර්ථ නිරූපණය**

උත්සව සහ රැස්වීම් වශයෙන් අර්ථ නිරූපණය කරනු ලබන්නේ, සාමාජිකයන්ගේ සහ විශේෂ ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් සංගමයේ සාමූහික කාර්යයක් ලෙස පවත්වනු ලබන හමුවීම්/සැසිවාර/සමාරම්භක උළෙල/සමාප්ති උත්සව යනාදිය වේ. සංගමය මගින් සංවිධානය කරනු ලබන චාරිකා, වැඩමුළු, සමාජසේවා ව්‍යාපෘති සඳහා මෙහි සඳහන් වගන්ති ප්‍රමාණාත්මක ව අදාළ කරගැනීම අපේක්‍ෂිත ය.

**නිර්දේශ**

### 1. පොදු කොන්දේසි.

1.1. සෑම උත්සවයක් ම සහ රැස්වීමක් ම පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් තරම් කල්වේලා ඇති ව සාමාජිකත්වය වෙත දැනුම් දිය යුතු ය.

1.2. උත්සව සහ රැස්වීම් සංවිධානය පිළිබඳ මූලික වගකීම සමස්ත අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් දරනු ලබන අතර, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණය පරිදි ඕනෑ ම එක් අධ්‍යක්‍ෂවරයෙකුට හෝ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් කිහිප පොළකට උත්සව සංවිධාන වගකීම භාරගත හැකි ය.

1.3. උත්සවයක් හෝ රැස්වීමක් පිළිබඳ කරනු ලබන කවර හෝ පෞද්ගලික හෝ පොදු දැනුම්දීමක සංගමයේ නිල නාමය (සිංහලෙන් හෝ/සහ ඉංග්‍රීසියෙන්) සඳහන් විය යුතු අතර, අවශ්‍ය නම් නිල ලාංඡනය ද භාවිත කළ හැකි ය.

1.4. සංගමයේ වගකීම යටතේ සංවිධානය කෙරෙන සෑම උත්සවයක්, රැස්වීමක් සඳහා ම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඒකමතික අනුමැතිය අවශ්‍ය කෙරේ.

1.5. උත්සව සහ රැස්වීම්වල දී සංගමයේත්, සාමාජික භවතුන්ගේත්, පිටස්තර ආරාධිතයින්ගේත්, ගෞරවය හා සුහදතාව සුරැකෙන අයුරින් හැසිරීම හා ක්‍රියාකිරීම සියලු සාමාජිකයින්ගේ වගකීම වේ.

1.5.1. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ වාතාවරණය සකස් කිරීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීමකි.

1.5.2. යථෝක්ත වාතාවරණය උල්ලංඝනය කිරීමට ක්‍රියාකරන සාමාජික භවතුන් සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් පත්කරනු ලබන විනය කමිටුවක් මගින් අවශ්‍ය පියවර ගත යුතු ය.

1.6. උත්සව, රැස්වීම් හා අනිකුත් සාමූහික කාර්යයන්හි දී මූල්‍ය හා ද්‍රව්‍යමය අවශ්‍යතා සඳහා පිටස්තර අනුග්‍රාහක භවතුන් සම්බන්ධ කරගැනීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ එකඟතාව අනුව සිදු කළ යුතු වේ.

1.7. සාමාජිකයන්ට අදාළ සෑම රැස්වීමක් ම නිල සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක හෝ, සාමාජික සංඛ්‍යාව සියය ඉක්මවීමෙන් හෝ පැවැත්විය හැකි ය.

1.8. කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා උත්සවයක් හෝ රැස්වීමක් නොපවත්වන්නේ නම්, ඒ බව අවම වශයෙන් දින තුනකට වත් පෙර හැකි කවර හෝ ආකාරයකින් ආරාධිත පාර්ශවයන් වෙත දැනුම් දිය යුතු වේ.

### 2. මහා සභා රැස්වීම

2.1. ව්‍යවස්ථාවෙන් නියම කොට ඇති පරිදි වාර්ෂික මහා සභා රැස්වීම්, අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම් සහ විශේෂ මහා සභා රැස්වීම් පැවැත්විය යුතු ය.

2.2. මහා සභා රැස්වීම් පැවැත්වීමේ පරිපාලන වගකීම ගරු විධායක අධ්‍යක්‍ෂවරයා සතු ය.

2.3. අදාළ ලිත් වර්ෂයට වලංගු සාමාජිකත්වය සහිත සෑම සාමාජික භවතෙකුට ම මහා සභා රැස්වීම් සඳහා සහභාගී වීමට අවකාශ ඇත.

2.4. වාර්ෂික හෝ අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම්වල ආරාධනාපත් සතියකට ප්‍රථම සාමාජික භවතුන් වෙත ලබාදිය යුතු අතර, සභාවේ න්‍යාය පත්‍රය ද ඒ සමඟ තිබිය යුතු ය.

2.5. රැස්වීමේ දී සියලු ම අධ්‍යක්‍ෂ භවතුන් සුදුසු ඇඳුමින් සැරසී ප්‍රධාන මේසයෙහි අසුන්ගත යුතු ය.

2.6. රැස්වීමේ ප්‍රධානත්වය සභාපති/අධ්‍යක්‍ෂවරයා විසින් දැරිය යුතු අතර, සභාපතිවරයා නොමැති අවස්ථාවන්හි අධ්‍යක්‍ෂ මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් පත්කරගත් අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයෙකු, වැඩ බලන සභාපතිවරයකු වශයෙන් එකී වගකීම දැරිය යුතු ය.

2.7. ප්‍රධාන මේසය පිටුපස රැස්වීමට මුහුණ ලා සංගමයේ ලාංඡනය සහිත ධජය ප්‍රදර්ශනය කළ යුතු අතර, සංගමයේ ජාත්‍යන්තර නියෝජනය ද ප්‍රදර්ශනය කළ හැකි ය.

2.8. මහා සභාවේ න්‍යාය පත්‍රය
- ආමන්ත්‍රණය
- පොල්තෙල් පහන දල්වීම
- සාමාජිකයින් අසුන් ගැනීම
- විනාඩියක නිහඬතාව
- පිළිගැනීමේ කථාව - සභාපති
- ලිපි ඉදිරිපත් කිරීම - විධායක අධ්‍යක්‍ෂ
- වාර්තා සභාගත කිරීම, සංශෝධන ඉදිරිපත් කිරීම සහ සම්මත කිරීම.
  - i). පසුගිය සභා රැස්වීමේ වාර්තාව
  - ii). ප්‍රගති වාර්තාව
  - iii). මුදල් වාර්තාව
  - iv). අදාළ වෙනත් වාර්තා

  (යථෝක්ත වාර්තා අතුරින් අදාළ රැස්වීමට අවශ්‍ය වාර්තා සීමා කොටගත හැකි ය.)

නිලධාරී මණ්ඩලය ඉල්ලා අස්වීම
තාවකාලික සභාපතිවරයකු පත්කිරීම
තාවකාලික ලේකම්වරයකු පත්කිරීම
නව අධ්‍යක්‍ෂ මණ්ඩලය පත්කිරීම
නව අධ්‍යක්‍ෂ මණ්ඩලය අසුන් ගැනීම
නව අධ්‍යක්‍ෂ මණ්ඩලය දිවුරුම් දීම

} වාර්ෂික මහා සභාවක දී පමණි

සාමාජික අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව
නව සභාපතිවරයාගේ ආමන්ත්‍රණය
විධායක අධ්‍යක්‍ෂවරයාගේ ස්තුති කතාව
සමාප්තිය
විසිරයාම
යථොක්ත න්‍යාය පත්‍රයට අවශ්‍ය වැඩිමනත් කරුණු අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ව එකඟතාව මත ඇතුළත් කළ හැකි ය.

## 3. උත්සව

3.1. සංගමයේ සියලු අංශ සම්බන්ධ උත්සව සංවිධානය අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ එකඟතාව පරිදි සිදුවිය යුතු ය.

3.2. මේ සඳහා සහභාගී වන සම්භාවනීය ආරාධිතයින් සහ බාහිර පුද්ගලයින්/පාර්ශවයන් සංගමයේ පරමාර්ථ කෙරෙහි පරස්පර විරෝධතා සහිත අය නොවිය යුතු ය.

3.3. උත්සව කටයුතු සංවිධානයෙහි මූලික අරමුණක් විය යුත්තේ සංගමයේ ජාතික සේවාව, ගෞරවනීය ප්‍රතිරූපය මෙන් ම සාමාජිකත්වයෙහි විනය ද සම්බන්ධ බාහිර සමාජයේ පැහැදීමක් ඇති කරලීම ය.

3.4. උත්සවයේ දී සියලු අධ්‍යක්‍ෂවරු ඊට සුදුසු ඇඳුමින් සැරසී ප්‍රධාන මේසයෙහි අසුන්ගත යුතු ය. එහි අධ්‍යක්‍ෂ මණ්ඩලයට අමතර ව ප්‍රධාන ආරාධිත අමුත්තා සහ විශේෂ ආරාධිතයා/ආරාධිතයින් පමණක් අසුන්ගත යුතු වේ.

3.5. උත්සව සභාවේ ප්‍රධානත්වය සභාපතිවරයා විසින් දැරිය යුතු අතර, නිවේදන කාර්යය අධ්‍යක්‍ෂ මණ්ඩලයට පිටස්තර අයෙකු විසින් සිදු කළ යුතු ය.

3.6. ප්‍රධාන මේසය පිටුපස රැස්වීමට මුහුණ ලා ජාතික කොඩිය සහ සංගමයේ ලාංඡනය සහිත ධජය ප්‍රදර්ශනය කළ යුතු ය. සංගමයේ ජාත්‍යන්තර නියෝජනය සහ උත්සවයේ විශේෂත්වය පිළිබඳ සඳහනක් ද එහි ඉදිරිපත් කළ හැකි ය.

3.7. උත්සවය අවස්ථාවේ සාමාජික විනය, නිහඬතාව සහ අවස්ථානුකූල යුතුකම් කෙරෙහි එළඹ සිටි සිහියෙන් යුතු ව කටයුතු කිරීම සියලු සාමාජික භවතුන්ගේ වගකීම වේ.

3.8. උත්සව සභාවේ න්‍යාය පත්‍රය (දළ සටහනකි)
ආමන්ත්‍රණය
පොල්තෙල් පහන දැල්වීම
අමුත්තන් අසුන් ගැනීම
ජාතික ගීය වාදනය
විනාඩියක නිහඬතාව
පිළිගැනීමේ කථාව - සභාපති
වෙනත් කථා
විශේෂ ත්‍යාග/සහතික/තිළිණ ප්‍රදානය කිරීම්
ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කථාව
ස්තුති කථාව
සමාප්තිය
විසිරයාම.

---

# වෘත්තීය කණ්ඩායමේ ඉන්දීය ඡායාරූප වැඩමුළුව



සංගමයේ වෘත්තීය කණ්ඩායම විසින් මෙහෙයවන ලද අති විශේෂ වැංසටහනක් වූ ඉන්දියානු ඡායාරූප වැඩමුළුව අති සාර්ථක ලෙස පසුගිය පෙබරවාරි මස 3 සිට 11 දිනවල දී පැවැත්විණි. අප සංගමය මගින් දිවයිනෙන් බැහැරව සංවිධානය කළ ප්‍රථම වැඩමුළුව ලෙස ද මෙය විශේෂ වැදගත්කමකින් යුක්ත වේ. (මීට පෙර 1995,1997 සහ 99 දී ඉන්දියානු චාරිකා තුනක් සංගමය මගින් සංවිධානය කොට තිබේ.)

පෙබරවාරි 03 දින සිට සතියකට වැඩි කලක් ඉන්දියාවේ තමිල්නාඩු සහ කර්නාටක ප්‍රාන්ත ආවරණය වන පරිදි චෙන්නායි- බැංගලෝර්- මයිසූර්- වෙල්ලෝරා- ඌටි ප්‍රදේශවල කි.මී. දෙදහසක චාරිකාව ද, බැංගලෝර් නගරයේ පැවැත්වූ නිරූපණ වැඩමුළුව ද, බැන්ඩිපූර්හි වනජීවී වැඩමුළුව ද මෙහි කැපී පෙනෙන අංග විය. නිරූපණ වැඩමුළුව ඉන්දියාවේ ප්‍රවීණ ඡායාරූප වෘත්තිකයෙකු වන ගුල්එච් ගුල්රාශ් මහතාගේ මෙහෙයවීමෙන් පැවති අතර ටී. පෙරුමාල්, යන බෙටර් ෆොටෝග්‍රැෆි සඟරාවේ ඡායාරූප ශිල්පීන් ද ඊට සම්පත් දායකත්වය සැපයූහ. එරට ජනප්‍රිය චිත්‍රපට හා ටෙලිනාට්‍ය ශිල්පිනීන් මෙන් ම නිරූපිකාවන් ද වන ශ්‍රී දේවි සහ වින්ධ්‍යා එහි සාර්ථකත්වයට අගනා දායකත්වයක් සැපයූහ.

අතුල රණරාජ, නාරද අමරතුංගආරච්චි යන අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන් ද උදේනි අල්විස්, සම්පත් පීරිස් යන වෘත්තීය කණ්ඩායමේ නියමුවන් ද දැඩි කැපවීමෙන් චාරිකා සංවිධාන කාර්යය ඉටුකළ අතර චාරිකා සම්බන්ධීකරණය හා මෙහෙයවීම සුනිල් වික්‍රම මහතා විසින් ප්‍රශස්ත ලෙස සම්පාදනය කොට තිබිණි.

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 60වන සංවත්සර සැමරුම් උළෙල

මෙම වැඩසටහන 2010 ඔක්තෝබර් මස කොළඹ ජාතික කලාභවන මුල් කොටගෙන සංවිධානය කිරීමට විධි විධාන සලස්වා ඇත. 15 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය, සංවත්සර සමරු නිකුත් කිරීම, ඡායාරූප ශිල්ප සම්මන්ත්‍රණ, තිළිණ ප්‍රදානය, අධ්‍යාපනික ප්‍රදර්ශනය, ශාස්ත්‍රීය හා සමරු ප්‍රකාශන එළිදැක්වීම, වෙළඳකුටි ප්‍රදර්ශනය ඇතුළු අංග ගණනාවක් මෙම උළෙලට ඇතුළත් වනු ඇත. මේ සියලු කාර්යයන් සඳහා ඔබගේ ශක්තිය, ධෛර්යය, ආශිංසනය, එක් කරලන්නට ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ඇරයුම් කර සිටී.

## 2010 - 60වන සංවත්සර වැඩසටහන් කමිටුව

| කමිටුව | සම්බන්ධීකාරක | ඇමතුම |
|---|---|---|
| 1. ප්‍රදර්ශන කමිටුව | එන්.ආර්. අභයසිංහ මහතා | 0777 688879 |
| 2. ප්‍රකාශන කමිටුව | විජය බස්නායක මහතා | 071 8229204 |
| 3. මූල්‍ය කමිටුව | සුනිල් ලියනගේ මහතා | 077 2614360 |
| 4. ප්‍රචාරක කමිටුව | උදේනි අල්විස් මහතා | 0777 751819 |
| 5. සංග්‍රහ කමිටුව | චම්පා කුරුප්පු මෙණෙවිය | 077 4698122 |
| 6. සාමාජික සහයෝගිතා කමිටුව | ඒ.ඩී. ගුණරත්න මහතා | 071 6390610 |
| 7. උත්සව සංවිධාන කමිටුව | තිලක වෙරළුපිටිය මහතා | 077 3231676 |
| 8. ආරක්ෂක කමිටුව | චායා අබේවර්ධන මහතා | 077 6114700 |
| 9. සැලසුම් කමිටුව | උ.ග. ගුණසේකර | 071 8106680 |
| i. අනුග්‍රාහකත්ව අනුකමිටුව | සුනිල් වික්‍රම මහතා | 071 2726517 |
| ii. සම්මන්ත්‍රණ අනුකමිටුව | චන්ද්‍රසේන පෙරේරා මහතා | 071 4749435 |
| iii. සැරසිලි අනුකමිටුව | කුමාර කරව්දෙණිය මහතා | 071 6144223 |
| iv. ශාලා සැලසුම් අනුකමිටුව | ප්‍රියන්ත අබේසුන්දර මහතා | 0777 416663 |
| v. බැනර් අනුකමිටුව | ජීවනී ශ්‍රියා ප්‍රියන්ති මෙණෙවිය | 071 8183669 |
| vi. වෙළඳ කුටි අනුකමිටුව | සම්පත් පීරිස් මහතා | 071 8202444 |
| vii. අධ්‍යාපනික ප්‍රදර්ශන අනුකමිටුව | වජිර වික්‍රමගේ මහතා | 011 2670790 |
| viii. සමරු භාණ්ඩ අනුකමිටුව | අශෝක බුද්ධදාස මහතා | 071 4402950 |
| ix. පවිත්‍රතා කටයුතු අනුකමිටුව | අශෝක ජේමසිරි මහතා | 071 2238411 |
| x. කාර්යමණ්ඩල කළමණාකරණ අනුකමිටුව | රාහුල පෙරේරා මහතා | 0777 309432 |

මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන සම්බන්ධීකරණ වගකීම ද, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු පිළිබඳ වගකීම ද, ප්‍රගති සමාලෝචන කාර්යය ද ඉටුකරනු ඇත.

සංගමයේ සංවත්සර උළෙල 2010 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ඊට අදාළ ඉහත අංශවල ක්‍රියාකාරකම් සාර්ථක ලෙස ඉටු කරගැනිමට ඔබගේ නොමසුරු දායකත්වය අත්‍යවශ්‍ය වේ. ඔබට සංගමය වෙනුවෙන් ඉටු කළ හැකි සෑම ආකාරයක ම දායකත්වයන් සඳහා ඉහත සාමාජික භවතුන් අමතා එම සහයෝගය ලබා දෙන්න.

## රූ රස කතිකාව - දස වන පියවර මැයි 02

සාමාජික ඔබ සැමට නව සිනමා අත්දැකීමක් තිළිණ කරලීම සහ සංගමයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන අවශ්‍යතාවක් සපුරාලනු පිනිස ආරම්භ කළ රූ රස කතිකාව වැඩසටහන් මාලාවේ මීලඟ අංකය මැයි 02 වන ඉරුදින කළුබෝවිල සංගම් මූලස්ථානයේ දී පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ වසන්ත ඔබේසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් මෙදින වැඩටහන පැවැත්වෙන අතර, 'ආගන්තුකයා' චිත්‍රපටය තිරගත කෙරෙනු ඇත.

මේ සඳහා මැයි 02 වන ඉරු දින පෙ.ව. 8.30 ට සංගම් මූලස්ථානය වෙත පැමිණෙන මෙන් ඔබට කාරුණිකව ආරාධනය කෙරේ. සංගමයේ පාඨමාලා හදාරන ඩිප්ලෝමා වර්ෂයේ විද්‍යාර්ථීන්ට මේ සඳහා සහභාගී වීම අනිවාර්යය වේ. අවශ්‍ය වැඩිමනක් තොරතුරු 071 - 5333318 අංකය අමතා ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ මහතාගෙන් ලබාගත හැකි ය.

පිළිසඳරට වෙහෙස මහන්සිය
ප්‍රකාශන අධ්‍යක්ෂ - ශාන්ත ගුණරත්න
ප්‍රකාශන අනු කමිටුව
ඉන්දික රත්නායක
විමල් ප්‍රියශාන්ත
දර්ශනී චතුරිකා

## සුබ මංගලම්



සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල් මහතා, නිශාදිනී මෙනෙවිය සමග 2010 මාර්තු 31 වැනි දින අතිනත ගත්තේ ය. එම දෙපළට අපේ සුබ පැතුම්.

## අපේ ශෝකය

■ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකා රාණි වීරවර්ධන මහත්මියගේ ස්වාමිපුරුෂයා වන තිලක් වික්‍රමසිංහ මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. එම අභාවය පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික A.S.B. වතුලන්ද මහතාගේ මෑණියන් පසුගිය දා අභාවප්‍රාප්ත වූවා ය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සංගමයේ වර්තමාන සභාපති ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතාගේ පියාණන් වූ ආනන්ද ගුණසේකර මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සංගමයේ වර්තමාන මුදල් අධ්‍යක්ෂ සුනිල් ලියනගේ මහතාගේ සොහොයුරා වූ H.L. සුනන්ද මහතා පසුගිය දා අප අතරින් වෙන් විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළකර සිටිමු.